**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - II කොටස - 2018**

-----------------------------------------------------------------

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

2015 ජුලි 08 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අනුව, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය ද මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ද වේ. මීරිගම සිට කුරුණෑගල දක්වා කි.මී 39.29 ක අධිවේගී මාර්ග කොටස ඉදිකිරීම තුළින් කලාප අතර උසස් සංචලතාවයක් පවත්වා ගැනීම සහ වාහන නඩත්තු වියදම් සහ මෙහෙයුම් වියදම්, ප්‍රවාහන කාලය, අනතුරු අවම කිරීම මඟින් ආර්ථික දියුණුව, සමාජ සහ විනෝදාස්වාදය සහ මගී පහසුව වැඩි දියුණු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 148,521ක් වන අතර එම මුදල ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය දේශීය වරලත් බැංකු සහ දේශීයව ක්‍රියාත්මක වන අන්තර්ජාතික බැංකු වලින් ලබාගන්නා ණය වලින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ ගිවිසුම 2016 දෙසැම්බර් මස අත්සන් කර තිබූ අතර 2017 ජනවාරි මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර 2019 ජුලි මාසයේදී වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

------

2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---------------------

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ  පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර  ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේ දී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි සඳහා ගෙවිය යුතුව තිබූ රු.මිලියන 429 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | වත්කම් හා වගකීම් අඩුවෙන් දැක්වීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂය අවසානයේ වූ මූල්‍ය තත්ත්වය ගිණුම්වලින් පිළිබිඹු විය යුතුය. |

## 03. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

අධිවේගී මාර්ගයේ II කොටසේ ඉදිකිරීම් කටයුතු උපකොටස් 04 කට බෙදා දේශීය කොන්ත්‍රාත්කරුවන් සමූහයක් වෙත ප්‍රධානය කර ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි මස සිට ආරම්භ කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව අධිවේගී මාර්ගයේ ආකෘතිමය කටයුතුවලට බිම් පාලම් 38, ගුවන් පාලම් 06 ක්, පාලම් 12 ක්, ආරුක්කු 36 ක් සහ බෝක්කු 106 ක් ඇතුළත්ව තිබුණි. මෙම ඉදිකිරීම් කටයුතු වලින් බිම්පාලම් 19 ක සහ බෝක්කු 72 ක ඉදිකිරීම් කටයුතු පමණක් 2018 දෙසැම්බර් 31 වන විට වැඩ අවසන් කර තිබුණි. එදිනට අනෙකුත් ආකෘතිමය ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සැලසුම් නිර්මාණ අදියරේ පැවතුණි. අපේක්ෂිත වැඩ අවසන් කිරීමේ දිනය අවස්ථා දෙකක දී දින 135 සිට දින 181 ක් දක්වා සංශෝධනය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ නිසා ඉදිකිරීම් වැඩ බිමේ අයිතිය බාර දීම ප්‍රමාද වීම, සැලසුම් හා ඇඳීම් කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වීමේ හැකියාව මෙන්ම මිල ඉහළ යාම සහ ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවීමේ හැකියාවක් පැවතුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැය වූ රු.මිලියන 148,520 ක් මහාභාණ්ඩාගාරය දේශීය වරලත් බැංකුවලින් ලබා ගන්නා ණයවලින් මූල්‍යනය කරන ලද අතර 2018 දෙසැම්බර් 31 දින වන විට එම ණයවලින් රු.මිලියන 59,510 ක් උපයෝජනය කර තිබුණි.

## 3.2 ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර II හි ඉඩම් අත්පත් කර ගැනීමේ සැලසුම අනුව රජයට අයත් ඉඩම් කට්ටි 786 ක් සමඟ මුළු ඉඩම් කට්ටි 4,778 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණු අතර මෙම ඉඩම් කට්ටිවලින් ඉඩම් කට්ටි 3,419 ක් අත්පත් කර ගෙන 2018 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා වන්දි වශයෙන් රු. මිලියන 6,305 ක් ගෙවා තිබුණි. තවද මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2018 ජූනි මාසයේ දී අවසන් කිරීම සඳහා කාර්ය මණ්ඩලයට දිරිදීමනා වශයෙන් රු. මිලියන 101.5 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා අමතර වියදම් දැරීමේ හැකියාවක් පැවතීම. | විගණන නිරීක්ෂණය කරුණක් වශයෙන් නිවැරදිය. ඉඩම් අත්පත් කර ගැනීම රාජ්‍ය ආයතන කිහිපයක නියමිත රාජකාරිවලට අමතරව සිදුකරන ඒකාබද්ධ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන අතර මාස 18 ක කාලයක් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. මෙම රාජ්‍ය ආයතනවල සම්පූර්ණ කැපවීම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා යොමුකර තිබුණ ද නිලධාරීන්ගේ නොසැළකිල්ල, මෙම කටයුතු සඳහා අකැමැතිකම, මහජන උද්සෝෂණ සහ ඉල්ලීම් වැනි ප්‍රායෝගික අපහසුතා නිසා ප්‍රමාද වීම් සිදු වී ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමට දායක වන අනෙකුත් ආයතනවල සහය ඇතිව ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු වේගවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |